# 2022 ජුලි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 ජුලි මස මාසික සභා රැස්වීම 2022.07.21 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

**<u>නිලධාරී සහභාගීත්වය</u>**

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය
3. කළමනාකරණ සේවා නිලධාරී - පී.කේ.ඩී.සී.කුමාරි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2022.06.09 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 2. <u>ගරු සභාපතිතුමාගේ නිවේදන</u>

#### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- පී.ඩබ්ලිව්.පියසේන නමින් ඇති අංකPL – 30 දරණ ජල බිල්පත ජී.ඩබ්ලිව්.ලාල් ප්‍රියන්ත පිල්ලවත්ත නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

- ඩී.කේ.පොඩිනෝනා නමින් ඇති අංකPL – 71 දරණ ජල බිල්පත නිරෝෂා ප්‍රනාන්දු නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 2.2. වැඩසටහන් අයවැය ලේඛනය පිළියෙල කිරීම 2023 - කාල සටහන

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2023 අයවැය පිළියෙල කිරීම සඳහා අයවැය කාල සටහන සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කල අතර ,අයවැය සඳහා යෝජනා සහ අදහස් 2022.08.31 දිනට පෙර ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

## 3. <u>සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා,සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවිය.

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. හෙළ බොජුන්හල තුල බයෝ ගෑස් නිෂ්පාදනය සඳහා බයෝ ගෑස් පද්ධතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ. ඩබ්ලිව්.කුමාර මැතිතුමා, මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තිබේද යන්න වැඩි දුරටත් විමසුවේය. එයට පිළිතුරු ලෙස ගරු සභාපතිතුමා,මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වන ඉඳුල් ආහාර ඕපනායක ඇඹළුම් කර්මාන්ත ශාලාවෙන් ලබා ගත හැකි බවත් එයට දිනකට ඉඳුල් බාස්කට් එකක් පමණ ප්‍රමාණවත් බවත් ප්‍රකාශ කිරීමෙන් පසුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. නව ජල සම්බන්ධතා ලබා දීම සම්බන්ධ ගිවිසුම් කෙටුම්පත අනුමත කර ගැනීමට අවශ්‍ය බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර් රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත වි

III. ඕපනායක ඇඟලුම් කම්හලෙන් කසල ලබා ගැනීම වෙනුවෙන් ගාස්තු අය කිරීම හා ගිවිසුම් කෙටුම්පත අනුමත කර ගැනීම අවශ්‍ය බවට යෝජනා කරන ලදි.
එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී ශ්‍රීමාවති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදි අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, දැනට පවතින එක් ගමන් වාරයක් සඳහා වන රු.1250.00 ක් අය කරන අතර ඒ සම්බන්ධව සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම මුදල රු.250.00 කින් වැඩි කර එක් ගමන් වාරයක් සඳහා රු.1500.00 ක් ලෙස අය කර ගැනීම සුදුසු බවට තීරණය කිරීමෙන් පසු එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IV. සී/ස පන්නිල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් ඉන්ධන ලබා ගැනීම සඳහා තබා ඇති රු.200,000.00 ක ඇප තැම්පතුව රු.300,000.00 දක්වා වැඩි කර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,ඉන්ධන මිල ඉහල යාමත් සමඟ මෙම ඇප තැන්පතුව රු.100,000.00 කින් වැඩි කිරීමට අවශ්‍ය වී ඇති බවත් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත් පැහැදිලි කිරීමෙන් පසු එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

V. රියදුරු එම්.ඒ.එන්.පී.මල්ලිකාරච්චි මහතාගේ සේවා ගිවිසුම් අළුත් කිරීම (2022.07.23 දින සිට ) අවශ්‍ය බව යෝජනා කරන ලදි

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් කුමාරරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

VI. ඊරියගස්මුල්ල,උඩවෙල,ඕපනායක ලිපිනයේ පදිංචි ඒ.බී.අයි. තිලිණි සුමනපාල මියට ගල්පොත්තේ වෙල ලියද්ද කුඹුරෙන් පර්චස් 13 ප්‍රමාණයක් නිවසක් ඉදි කිරීම සඳහා කාර්මික නිලධාරිවරයාගේ කොන්දේසි හා නියමනයන්ට යටත්ව ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා මෙම කුඹුරු ඉඩම් කොටස් කාර්මික නිලධාරීන් විසින් පරීක්ෂා කර ඇති බවත්,ඔවුන්ගේ නිර්දේශයන්ට යටත්ව නිවසක් ඉදි කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවත් සඳහන් කල අතර එම ඉඩමට අදාල පිඹුරුපත ඇතුළු ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරිපත් කර ඇති ලිපි ලේඛනද සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VII. ගලි ප්‍රතිකාරක මධ්‍යස්ථානයේ යන්ත්‍ර ක්‍රියාකරු ලෙස කේ.පී.මධුරංග දිල්ශාන් යන අය සේවා ගිවිසුම් මත බඳවා ගැනීම යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඒ.එම්.අයි.පි.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මිල්ලගහවංගුවේ සිට කෙසෙල්වත්ත පන්සල දක්වා මාර්ගය ජේ.සී.බී.යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

## 6.1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.06.10 හා 2022.06.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. ප්‍රසම්පාදන වාර්තා

2022.06.09,2022.06.16 හා 2022.06.27 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2022 මැයි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 412,810.99 | වැටුප් හා දීමනා | 4,241,572.37 |
| කුලී | 469,340.19 | ගමන් වියදම් | 11,052.00 |
| බලපත්‍ර ගාස්තු | 15,250.00 | සැපයුම් හා උපකරණ | 755,106.00 |
| සේවා සඳහා ගාස්තු | 37,420.00 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,111,855.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 4,828.34 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 134,458.14 |
| වෙනත් ආදායම් | 493,442.27 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 4,902.740.74 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 6,335,832.53 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 16,336.02 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 6,270,379.53 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 6,335,832.53 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 147,014.67 | සේවක ණය | - |
| තැන්පත් | 37,415.00 | තැන්පත් | 154,517.20 |
| අත්තිකාරම් | - | ණයහිමි | 10,095.00 |

| | | | |
|---|---|---|---|
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | 464,217.62 |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 184,429.67 | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 628,829.82 |
| මුළු එකතුව | 6,520,262.20 | මුළු ගෙවීම් | 6,899,209.35 |

## 7.2. 2022 මැයි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව, ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

## 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, වර්තමානයේ පවතින ඉන්ධන ගැටළුව හමුවේ ගරු මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමට විධිමත් ක්‍රමයක් වැලිගෙපොල හා ඕපනායක කොට්ඨාස දෙකෙහි ප්‍රාදේශීය ලේකම්වරුන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් සමඟ සාකච්ඡා කර සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, දෙල්ගස්හන්දිය IOC ඉන්ධන පිරවුම්හලෙන් ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉන්ධන ලීටර් 150ක් ඉල්ලුම් කලද එය නිසි පරිදි ලබා නොදුන් බව ප්‍රකාශ කළේය. එසේ සභා බල ප්‍රදේශයේ පවතින ඉන්ධන පිරවුම්හල් වෙතින් සභාව වෙනුවෙන් ඉන්ධන ප්‍රමාණයක් වෙන් නොකරන්නේ නම් ඉදිරි වර්ෂයන් සඳහා වෙළඳ බලපත්‍ර සභාව මඟින් නිකුත් නොකරන බව ඉන්ධන පිරවුම්හල් කළමණාකාරිත්වය වෙත දන්වන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා, ඇතුළු ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය

ඕපනායක පොළ භූමිය අපවිත්‍ර වී ඇති බැවින් එය නිසි පරිදි පිරිසිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය ඉල්ලා සිටියාය.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, වැලිගෙපොල කොට්ඨාසයේ ඌරාවල වසමේ අඩු ආදායම් ලාභීන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සහල් සහනාධාර ලබා දීමේදී රු.50.00 ක මුදලක් අයකරගෙන ඇති බවත්,රු.5000.00ක සමෘද්ධි සහනාධාර ලබා දීමද අයථා ලෙස සිදු වී ඇති බවට

කරුණු අනාවරණය කල අතර එම සහනාධාර බෙදා දී ඇති ක්‍රමවේදය හා සහනාධාර ලබා දුන් නාම ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලෙස සඳහන් කළාය.

එයට අදහස් එක් කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා,වැලිගෙපොල කොට්ඨාසයම ආවරණය වන පරිදි සහනාධාර බෙදා දීම සම්බන්ධව විස්තර වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව සඳහන් කළේය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය

ඕපනායක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුල සහනාධාර ලබා දිය යුතු පුද්ගලයින්ට ලබා දී නොමැති බවට කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමිය ඕපනායක කොට්ඨාසයේද සහනාධාර බෙදී යාම සම්බන්ධව වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියාය.

තවද බළන්ගොඩ රත්නපුර ප්‍රධාන මාර්ගයේ කරගහයට හන්දිය අසල බස් නැවතුම්පළක් ඉදිකිරීම සඳහා අදාල ඉඩම් හිමියන්ගෙන් විරෝධතාවක් නොමැති බැවින් එම බස් නැවතුම්පළ ඉදිකිරීමේ ඉදිරි වැඩ කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටියාය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා ප්‍රථමයෙන්ම අටවන විධායක ජනාධිපතිතුමා ලෙස පත්වූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතූ අතර නව ජනාධිපතිතුමාගේ ඉදිරි වැඩ කටයුතු සඳහා සහයෝගය ලබාදෙන බවද ප්‍රකාශ කළේය. තවද වැලිගෙපොල හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරුන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් සමඟ සාකච්ඡා කර ඕපනායක හා වැලිගෙපොල ඉන්ධන පිරවුම්හල් වලින් මෙම බල ප්‍රදේශයේ ජනතාවට පමණක් ඉන්ධන සැපයීමට කටයුතු සැලැස්විය යුතු බවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාව සඳහා ඉන්ධන ලබා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, හඳගිරිය වී අස්වනු තිබෙන පවුල් සඳහාද සහල් සහනාධාර ලබා දී ඇති බැවින් එම සහනාධාර විධිමත් ක්‍රමවේදයක් මඟින් සුදුසු පාර්ශවයන්ට ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

ප්‍රථමයෙන් නව ජනාධිපති ලෙස පත් වූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමිය, වර්තමානයේ රට තුල පවතින තත්වය හමුවේ මහජන නියෝජිතයින් සමාජයේ පොදු හතුරෙකු ලෙස සලකා ජනතාව කටයුතු කිරීමට පෙළඹී ඇති බවත් , ප්‍රාදේශීය මහජන නියෝජිතයින් ලෙස සමාජය තුල ගෞරවාන්විතව කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සැළසිය යුතු බව සඳහන් කළාය.

එසේම, සහනාධාර බෙදාදීමේ ගැටළු සම්බන්ධයෙන් ද අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය එම සහනාධාර දේශපාලන පක්ෂ නොතකා සාධාරණ අයුරින් ලැබිය යුතු පුද්ගලයින්ට ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර මේ දින වල පවතින ඉන්ධන මාපියාව සිදුකරන පුද්ගලයින්ට නිලතල තනතුරු නොසලකා දඬුවම් ලබා දී, සාධාරණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටියාය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

උඩවෙල අකරුල්ල මාර්ගයේ අබලන් වී ඇති පළමු කිලෝමීටර් තුනක කොටස කඩිනමින් පිළිසකර කර දෙන ලෙස දන්වා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් හා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු දැනුවත් කර කඩිනමින් විසඳුම් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී. තවද ගරු මන්ත්‍රීතුමා, ඉන්ධන ගැටලුව විසඳා ගැනීම සඳහා IOC ඉන්ධන පිරවුම්හලේ පරිපාලන නිලධාරිතුමාට ලිපියක් යොමුකරන ලෙස ඉල්ලා සිටියේය.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, අයථා ලෙස ඉන්ධන එක් රැස් කර ළඟ තබා ගන්නා පුද්ගලයන් සොයා බලා ඒ සඳහා අදාළ නීතිමය පියවර ගන්නා මෙන් වැලිගෙපොල හා ඕපනායක පොලිස් ස්ථානාධිපතිවරුන් හට දැනුම් දෙන මෙන් ඉල්ලා සිටියේය.

**සභා රැස්වීමේ නිමාව**

පවතින ඉන්ධන අර්බුධය හේතුවෙන් පැන නැගී ඇති ගැටළු ඉදිරියේදී නිරාකරණය කිරීමට තමන් උත්සහ ගන්නා බවත්, බල ප්‍රදේශය තුළ ජනතාව මුහුණ දී ඇති ගැටළු වලට සභාව විසින් මැදිහත් විය හැකි සෑම ආකාරයකින්ම මැදිහත්ව කටයුතු කරන බවත්, රට පත්වී ඇති තත්වයෙන් මිදීම සඳහා දේශපාලන අරමුණු නොතකා සියළු දෙනා එක්ව කටයුතු කළ යුතු බව පැවසූ ගරු සභාපතිතුමා , අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින් දහවල් 12.00 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව